**ශීර්ෂය 203 - ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 විගණන මතය

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව හා විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින්

කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන්  වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු.125,148 ක් වූ අතර 2019 අප්‍රේල් 30 දින වන විටත් එම ශේෂයන් අයකර ගෙන නොතිබුණි. ඉන් රු.14,590 ක් වර්ෂ 5කට වැඩි කාලයක සිට අයවිය යුතුව පැවතිණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් ප්‍රකාරව කඩිනමින් කටයුතු කළ යුතු වීම. | රු.110,558 ක ණය ශේෂය සම්බන්ධව කටයුතු කිරීමට ඇපකරුවන් පිළිබඳ විස්තර ලබාගැනීම සඳහා ණය ලිපිගොනුව අප දෙපාර්තමේන්තුව වෙත එවන ලෙස දන්වමින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති පරිදි කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂය 01 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 4 ක් සඳහා සලසා ගෙන තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.25,566,592 ක් හෙවත් සියයට 15 සිට සියයට 54 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | සලසාගත් ප්‍රතිපාදන වලින් අදාල කාර්යය සිදු කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රමාණවත් අක් මුදල් නොලැබීම, අපේක්ෂිත වියදම් ඇති නොවීම, අලුත් වැඩියාවන් අවම වීම, ඇතැම් ව්‍යාපෘති ආරම්භ නොකිරීම වැනි කරුණු හේතුවෙන් ඉතිරි වීම් සිදුවිය. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 94 (I) ප්‍රකාරව සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා වියදමක් හෝ බැදීමක් ඇතිකර නොගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වැය විෂයයන් 5 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉතිරිය වූ රු.18,888 ක් ඉක්මවා රු.447,266ක බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන සීමාව තුල වියදම් හෝ බැඳීම් ඇති කර ගත යුතුය. | වර්ෂ අවසානයේ පැවැත්වෙන රාජ්‍ය නත්තල් උත්සව හා වෙනත් උත්සව සංවිධානය කිරීමේ කටයුතු, සංයුක්ත දීමනා සංශෝධනය, නවක නිළධාරීන් බඳවා ගැනීම හා විවිධ ශිවිසුම්ගත සේවා වෙනුවෙන් වියදම් දැරීමට සිදුවීම මේ සඳහා හේතු විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2010 නොවැම්බර් 10 දින ඇති වූ හදිසි ගංවතුර තත්ත්වය හේතුවෙන් දහම් පාසල් ගුරුභවතුන්ගේ නිළ ඇඳුම් 430 කට හානි වී තිබුණු අතර ඉන් සිදුවූ අලාභය රු.354,750 ක් විය. මුදල් රෙගුලාසි 105 ට අනුව අයකර ගත හැකි වටිනාකම රු.107,500 ක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මෙම අලාභය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියලුම හානි හා පාඩු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අත් වැරදීමකින් එම අගය සටහන් 1හි පෙන්වා නොතිබූ අතර එය නිවැරදි ලෙස සකස් කර ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතේ වන කාර්යයන් සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද, ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයේ අරමුණු ඉටු කර ගැනීමට දායක විය යුතුය. | දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සාධාරණ සමාජයක් උදෙසා ඉලක්ක මත ළඟාවීම මැන බැලීමට අවශ්‍ය වන දර්ශක හඳුනාගෙන මින් ඉදිරියට කටයුතු කරන බවද කාරුණිකව දන්වා සිටිමි. |

## 5. යහපාලනය

### 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2008 පෙබරවාරි 06 දිනැති අංක 5/2008 හා 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 (1) දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව සියළුම රාජ්‍ය ආයතනවල පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තියක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකල යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. | දෙපාර්තමේන්තුව ආරම්භක අවධියේ 2008 වර්ෂයේදී පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සකස් කර බුද්ධශාසන අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී. දැනට එය අස්ථානගතවී ඇති බැවින් දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යන් හී ස්වභාවයද එකී වකවානුවට වඩා වෙනස් වී ඇති හෙයින්ද පුරවැසි ප්‍රඥප්තිය නැවත සකස් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. |